**1.1** **මතය**

**ලංකා හොස්පිටල් ඩයග්නොස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි (සමාගම) 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය , ලාභාලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනේ අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් , සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධි විධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**සමාගමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතයවේ.**

**1.2** **මතය සඳහා පදනම**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.**

**සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.**

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.**

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචාවක් හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් හඳුනා නොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර , දුස්සන්ධානය , ව්‍යාජ ලේඛන සැකසීම , චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇති වීමට හේතුවේ.

- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුවේ.මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම්වේ.කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය , පද්ධති , පටිපාටි , පොත් පත් , වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී , පද්ධති , පටිපාටි , පොත් පත් , වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව , සමාගම ක්‍රියා කර ඇති බව,
- සමාගම සිය බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව
- සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස , කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදිය අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය PED 12 | • 9.7 වගන්තියට අනුව වැටුප් හා දීමනා අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ යෝජනා ක්‍රම මත පදනම් විය යුතු අතර භාණ්ඩාගාරයේ ලේකම්ගේ අනුමැතියකින් තොරව සංශෝධනයකට ඉඩ නොදේ. කෙසේ වෙතත්, සමාගම එම අවශ්‍යතාවයට අනුකූල නොවීය.<br>• චක්‍රලේඛයේ 9.2. ඇ වගන්තියේ සඳහන් වූයේ සංවිධාන සටහන සහ අනුමත සේවක සංඛ්‍යාව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතු බවයි. කෙසේ වෙතත්, සමාගම ඊට අනුකූල නොවීය. | ලංකා හොස්පිට්ල්ස් ඩයග්නොස්ටික්ස් (පුද්) සමාගම (එල් එච් ඩී ) යනු 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නිසි පරිදි සංස්ථාගත කර ඇති අතර පුද්ගලික සීමිත වගකීම් සමාගමක් ලෙස ක්‍රියාත්මක වේ.<br>තවද, එල්එච්ඩී යනු ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී හි පූර්ණ අනුබද්ධ සමාගමකි. ශ්‍රී ලංකා රසායනාගාර කර්මාන්තය අතිශයින්ම තරඟකාරී වන අතර එය සාර්ථක කර ගැනීම සහ ක්ෂේත්‍රයේ සැලකිය යුතු වෛද්‍ය රසායනාගාර සේවා සපයන්නෙකු ලෙස හඳුනා ගැනීමට වෙළඳපොලේ ඇති අනෙකුත් පෞද්ගලික වෛද්‍ය රසායනාගාරවලට සමගාමීව | රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට පියවර ගත යුතුය. |
| රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය PED 1/2015 | • PED 1/2015 රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව, සමාගම විසින් ප්‍රධාන විධායක නිලධාරියාට දුරකථන දීමනා ව අදාල සීමාව ඉක්මවා වැඩිපුර | එල්එච්ඩී සිය ක්‍රියාකාරකම් සිදු කළ යුතුය. එබැවින්, වෙළඳපල තුළ තරඟකාරී වීමට නම්, තරඟකාරී වැටුප් හා වැටුප් ලබා දෙන දක්ෂ හා දක්ෂ කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම හා පවත්වාගෙන යාම එල්එච්ඩී | රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට පියවර ගත යුතුය. |

| | |
|---|---|
| රුපියල් 3,300 ක් ලබා දී ඇත.<br>• රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව, සමාගම විසින් ප්‍රධාන විධායක නිලධාරියාට සහ ප්‍රධාන මෙහෙයුම් නිලධාරියාට පිළිවෙලින් ලීටර 100 සහ ලීටර 35 යන සීමාවන් ඉක්මවා ඉන්ධන දීමනා ලබාදීමට කටයුතු කර ඇත. | ආයතනයට සිදු වේ. කෙසේ වෙතත්, ඉහත සඳහන් සාධක හේතුවෙන් විශේෂ අවස්ථා වලදී සහන ලබා ගැනීම සඳහා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවෙන් එකී PED චක්‍රලේඛවලට අදාළ උපදෙස් ලබා ගැනීමට සමාගම සැලසුම් කරයි. |

**2.** මූල්‍ය සමාලෝචනය
--------------------------

**2.1** මූල්‍ය ප්‍රතිඵලය
------------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 299,707,855 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභයය රු. **254,798,395** ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 44,909,460 ක් හෝ **14.98** ප්‍රතිශතයකින් වර්ධනයක් නිරීක්ෂණය විය.

**2.2** අනුපාත විශ්ලේෂණය
---------------------------

| | 2019 | 2018 |
|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය | 3.01 වතාවක් | 3.60 වතාවක් |
| ක්ෂණික වත්කම් අනුපාතය | 2.74 වතාවක් | 3.24 වතාවක් |
| දළ ලාභ අනුපාතය | 58.86% | 52.43% |
| යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ | 25.10% | 32.62% |
| තෝලන අනුපාතය | 32.10% | - |

**3.** මෙහෙයුම් සමාලෝචනය
-------------------------------

**3.1** මතභේදයට තුඩු දෙන ගනු දෙනු
------------------------------------------

| විගණන නිරීක්ෂණ | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෛද්‍යවරයාගේ අදහස් දැක්වීම පාදක කර ගෙන රසායනාගාර පරීක්ෂණ සඳහා කල් ඉකුත්වූ ඖෂධ භාවිතා කිරීම සමාගම විසින් සාමාන්‍යයෙන් අනුගමනය කරන පිළිවෙලයි. | කල් ඉකුත් වූ තොග අයිතම තත්ව පාලන දෙපාර්තමේන්තුවේ දැඩි පාලනය යටතේ භාවිතා වේ. මෙය කර්මාන්ත පුහුණුවක් වන අතර කල් ඉකුත් වූ උත්තේජකයන් භාවිතා කිරීමේදී අනුගමනය කරනු ලබන හොඳ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටියක් (SOP) අප සතුව ඇත. | ගුණත්වය ආරක්ෂා කරන අතරතුර කර්මාන්තයේ සම්මතයන් සහ රීතීන් සමග අනුගත විය යුතුය. |

## 3.2 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාද වීම

| විගණන නිරීක්ෂණය | | | | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර තිබුණද පහත සඳහන් ප්‍රසම්පාදන වර්ෂය තුල ක්‍රියාත්මක නොවීය. | | | | | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මුල් පිටපත නිරන්තරයෙන් අධීක්ෂණය කර යාවත්කාලීන කළ යුතුය. (ප්‍රසම්පාදන මාර්ගෝපදේශය **4.2.1.)** |
| | විස්තරය | උප ඒකකය | සම්පූර්ණ කිරීමට සැලසුම් කළ දිනය | | |
| **01.** | ස්ලයිඩින් ගබඩා කැබිනට් | හිස්ටොපොතොලොජි | **2019** ජනවාරි | **01.** පවතින ප්‍රාග්ධන අයිතම සමඟ කළමනාකරණය කර ඇත. අවශ්‍යතාවය **2020** වසරට මාරු කරන ලදි. | |
| **02.** | අතින් ක්‍රියාකරන අයි එච් සී ස්ටයිනර් | හිස්ටොපොතොලොජි | **2019** ජනවාරි | **02.** මිලදී ගැනීම ප්‍රමාද වූ අතර පවතින සම්පත් සමඟ කළමනාකරණය කර ගන්නා ලදී. | |
| **03.** | අන්වීක්ෂය | රාජකීය රෝහල් විද්‍යාගාරය | **2019** පළමු කාර්තුව | **03.** පවතින ප්‍රාග්ධන අයිතම සමඟ කළමනාකරණය කර ඇත. අවශ්‍යතාවය **2020** වසරට මාරු කරන ලදි. | |
| **04.** | අන්වීක්ෂය | ගාල්ල විද්‍යාගාරය | **2019** පෙබරවාරි | **04.** පවතින ප්‍රාග්ධන අයිතම සමඟ කළමනාකරණය කර ඇත. අවශ්‍යතාවය **2020** වර්ෂයේ අයවැයට මාරු කර ඇත. | |
| **05.** | කැටි ගැසීම් විශ්ලේෂකය | කුරුණෑගල විද්‍යාගාරය | **2019** දෙසැම්බර් | **05.** කුරුණෑගල - නව විද්‍යාගාර ව්‍යාපෘතිය **2020** වසරට මාරු කරනු ලැබේ. | |

| | | | | |
|---|---|---|---|---|
| 06. | ඩෙස්ක්ටොප් පරිගණක | කුරුණෑගල විද්‍යාගාරය | 2019 දෙසැම්බර් | 06. කුරුණෑගල - නව විද්‍යාගාර ව්‍යාපෘතිය 2020 වසරට මාරු කරනු ලැබේ. |
| 07. | උපකරණ අතුරුමුහුණත | කුරුණෑගල විද්‍යාගාරය | 2019 දෙසැම්බර් | 07. කුරුණෑගල - නව විද්‍යාගාර ව්‍යාපෘතිය 2020 වසරට මාරු කරනු ලැබේ. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ සත්‍ය සේවක සංඛයාව ආයතනය විසින් අනුමත කර ඇති සේවක සංඛ්‍යාව ඉක්මවා ඇත. 2020 ජුනි මාසය සඳහා ගනු ලැබූ තොරතුරු පහත පරිදි වේ. | | අනුමත සේවක සංඛ්‍යාව සඳහා වරින් වර අධ්‍යයනය කරමින් සංශෝධනයන් කළ යුතු අතර සංශෝධනයන් සඳහා අදාළ අනුමැතියන් ගත යුතුය. |

| | තනතුර | අතිරික්තය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 1.1 | අනුරාධපුර මිනි විද්‍යාගාරය - වෛද්‍ය රසායනාගාර තාක්ෂණ නිලධාරියා | 01 | 1.1 අයවැයගත නව බඳවා ගැනීම් - 2019 |
| 1.2 | අනුරාධපුර මිනි විද්‍යාගාරය - අභ්‍යාසලාභී වෛද්‍ය රසායනාගාර තාක්ෂණ නිලධාරියා | 01 | 1.2 අයවැයගත නව බඳවා ගැනීම් - 2019 |
| 2 | මූල්‍ය විධායක - මූල්‍ය අංශය | 01 | 2.එක් මූල්‍ය සහායකයකු 2020 දී විධායක - මූල්‍ය ලෙස උසස් කරන ලදී. |
| 3 | හිමටලොජි - අභ්‍යාසලාභී වෛද්‍ය තාක්ෂණ නිලධාරියා | 01 | 3.වෛද්‍ය තාක්ෂණ නිලධාරියායෙකුගේ තනතුර අභ්‍යාසලාභී වෛද්‍ය තාක්ෂණ නිලධාරියායෙකු විසින් ප්‍රතිස්ථාපනය කරන ලදී. |
| 4 | මහනුවර විද්‍යාගාරය - වැඩබලන අධීක්ෂක විකුණුම් සංවර්ධනය | 01 | 4. විකුණුම් සංවර්ධන සහකාර වැඩබලන අධීක්ෂක විකුණුම් සංවර්ධනය ලෙස උසස් කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| **5.1** | ලොජිස්ටික්ස් - වැඩබලන අධීක්ෂක විකුණුම් සංවර්ධනය | **01** | **5.1.**විකුණුම් සංවර්ධන අධීක්ෂක වෙනුවට වැඩබලන අධීක්ෂක විකුණුම් දෙපාර්තමේන්තුවක් පත් කරන ලදී. |
| **5.2** | ලොජිස්ටික්ස් - විකුණුම් සංවර්ධන සහකාර | **01** | **5.2.**විකුණුම් සංවර්ධන අධීක්ෂක වෙනුවට විකුණුම් සංවර්ධන සහායකයෙකු පත් කරන ලදී. |
| **6.1** | අලෙවිකරණය - සහකාර කළමනාකරු - ව්‍යාපාර සංවර්ධනය | **01** | **6.1.**ජ්‍යෙෂ්ට විධායක ව්‍යාපාර සංවර්ධනය සහකාර කළමනාකරු - ව්‍යාපාර සංවර්ධන ලෙස උසස් කරන ලදී. |
| **6.2** | අලෙවිකරණය - විධායක - ව්‍යාපාර සංවර්ධනය | **01** | **6.2.**විකුණුම් කළමණාකරු සඳහා වූ සේවක තනතුර මානව සම්පත් තනතුරක් වෙත මාරු කරනු ලබන අතර විධායක මානව සම්පත් තනතුර අලෙවිකරණයට මාරු කරනු ලැබේ. එබැවින් අතිරේක විධායක-ව්‍යාපාර සංවර්ධන සේවක තනතුරක් පිළිබිඹු වේ, කෙසේ වෙතත් මෙම වෙනස සේවක සංඛ්‍යාව තුළ වේ. |
| **7** | ක්ෂුද්‍රජීව විද්‍යාව - අභ්‍යාසලාභී වෛද්‍ය තාක්‍ෂණ | **02** | **7.**වෛද්‍ය තාක්‍ෂණවේදී තනතුරු දෙකක් වෙනුවෙන් පුහුණු වන වෛද්‍ය තාක්‍ෂණවේදියෙකු ආදේශ කරන ලදී. |
| **8** | අණුක ජීව විද්‍යාව - වැඩ බලන අධීක්ෂක අණුක ජීව විද්‍යාව | **01** | **8.**වෛද්‍ය තාක්‍ෂණවේදීයා, අණුක ජීව විද්‍යාවේ වැඩබලන අධීක්ෂක ලෙස උසස් කරන ලදී. |
| **9.1** | නියැදි එකතු කිරීම - සම්බන්ධීකාරක රසායනාගාරය | **01** | **9.1.**පාරිභෝගික සම්බන්ධතා නිලධාරී රසායනාගාර සම්බන්ධීකාරක ලෙස උසස් කරන ලදී. |
| **9.2** | නියැදි එකතු කිරීම - ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකාරක රසායනාගාරය | **01** | **9.2.**රසායනාගාර සම්බන්ධීකාරක ජ්‍යෙෂ්ඨ රසායනාගාර සම්බන්ධීකාරක ලෙස උසස් කරන ලදී. |
| **9.3** | නියැදි එකතු කිරීම - අධීක්ෂක - ෆ්ලෙබෝටෝමි | **01** | **9.3.**ෆ්ලෙබෝටෝ මිස්ට්, අධීක්ෂක ෆ්ලෙබෝටෝමිස්ට් ලෙස උසස් කරන ලදී. |
| **9.4** | නියැදි එකතු කිරීම - අභ්‍යාසලාභී ෆ්ලෙබෝටෝමි | **03** | **9.4.**ෆ්ලෙබෝටොමිස්ට් තනතුරු තුන වෙනුවට අභ්‍යාසලාභී ෆ්ලෙබෝටොමිස්ට් තනතුරු ආදේශ කරන ලදී. |